# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX | YEAR OF OUR LORD JESUS CHRIST, 2025 JUNE | Issue No. 07


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 27:1-6)

01. ස්වාමීන්වහන්සේ මාගේ ආලෝකයත් ගැළවීමත්ය; මම කාට භයවන්නෙම්ද? ස්වාමීන්වහන්සේ මාගේ ජීවිතයේ ශක්තියය; මම කාට භීතවන්නෙම්ද?

02. නපුරුකම්කරන්නෝ එනම් මාගේ විිරුද්ධකාරයන් හා සතුරෝ මාගේ මාංසය කන පිණිස මට විරුද්ධව ආ කල පැකිල වැටුණෝය.

03. සේනාවක් මට විරුද්ධව කඳවුරු බැන්දත්, මාගේ සිත භය නොවන්නේය. මට විරුද්ධව යුද්ධයක් හටගත්තත්, එකල්හිත් මම සුරක්ෂිතව සිටින්නෙමි.

04. ස්වාමීන්ගෙන් එක දෙයක් ඉල්ලීමි, ඒක සොයන්නෙමි; එනම් ස්වාමීන්ගේ අලංකාරය දකින පිණිසත් උන්වහන්සේගේ මාලිගාවේදී භාවනාකරන පිණිසත් මාගේ ජීවිතයේ සියලු දවස්වලදී ස්වාමීන්ගේ ගෘහයෙහි වාසය කිරීමය.

05. මක්නිසාද විපත්ති දවසේදී උන්වහන්සේ ස්වකීය විමානයෙහි මා වසා තබනසේක, ස්වකීය මණ්ඩපයෙහි වූ අප්‍රකාශ ස්ථානයෙහි මා සඟවනසේක; උන්වහන්සේ පර්වතයක් පිට මා ඔසවා තබනසේක.

06. දැනුදු මා අවට සිටින මාගේ සතුරන්ට ඉහළින් මාගේ හිස ඔසවනු ලබන්නේය; උන්වහන්සේගේ මණ්ඩපයෙහි ප්‍රීති පූජා පුදන්නෙමි; ස්වාමීන්ට ගීතිකා කරන්නෙමි, එසේය, ප්‍රශංසා ගී කියන්නෙමි.

# ඔබගේ උරුමය ඔබගේ දරුවන්ට තබා යනවාද?

*Sis. Angel*

## ARE YOU LEAVING A LEGACY TO YOUR CHILDREN?



අපගේ ස්වාමීන් වහන්සේ සහ ගැලවුම්කාර වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් කැඳවීමේ ප්‍රතිරාවය පවුලේ ප්‍රේමණීය සාමාජිකයින්ගේ සුභ පැතුම් ඔබ වෙත ගෙනෙමි!

2025 වන වර්ෂයේ දැනටමත් අප මාස හයක කාලයක් ගෙවා අවසන්ව ඇති බව අපට විශ්වාස කිරීමට ඉතා අසීරුය. මේ වසර ආරම්භ වී වසරෙන් අඩක්ම සම්පූර්ණ කරන විට හබක්කුක් පොතේ 3:2 වන පදය මගේ මතකයට නැගෙයි. **"…..අවුරුදු අතරතුරේ ඔබගේ ක්‍රියා කිරීම ප්‍රාණවත් කළ මැනව."** ස්වාමීන් වහන්සේ ඔබව ද ඔබගේ පවුලේ අයවද ඔබගේ ව්‍යාපාර කටයුතුද ඔබගේ රැකියාවද නැතිනම් ඔබගේ අනෙකුත් අවශ්‍ය කටයුතුවලට දිව්‍යමය දයාව දෙමින් උන්වහන්සේගේ කරුණාවෙන් මේ සෑම දේම ප්‍රාණවත් කරන්න කියා මා යාච්ඤා කරමි.

පසුගිය මාසයේදී මම නැතිවූ බැටළුවාගේ උපමාව හා නැති වූ බැටළුවා සොයාගෙන පැමිණි එඬේරා ගැනත් ඉතිරිව සිටි බැටළුවන් අනූ නව දෙනා ගැනත් නැති වූ එක බැටළුවා ගැනත් ලූක් ශුභාරංචියේ 15 වන පරිච්ඡේය තුළින් මා කතා කළෙමි. මුළු පරිච්ඡේදයම 99:9:1 ලෙසට සාරාංශ

3 වෙනි පිටුවට …




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *



# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## *from your dearly beloved brother...*

REACHING NATIONS



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**HON. EDITOR-IN-CHIEF**

Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**EX MANAGING EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.

**ADMINISTRATION**

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**

Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858

**E.MAIL**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

**YOUTUBE CHANNEL**

Echo of His Call


"අපේ උපකාරය අහසත් පොළොවත් මැවූ ස්වාමීන්ගේ නාමය කෙරෙහිය."
(ගීතාවලිය 124:8)

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

අපගේ ස්වාමී වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් උන්වහන්සේගේ කරුණාව, සමාදානය හා යහපත්කම ඔබ සමග තිබේවා.

අප සේවය කරනු ලබන්නේ යහපත් හා විශ්වාසවන්ත වූ දෙවියන්වහන්සේටය. එම නිසා උන්වහන්සේ අපව ගෙනා මාර්ගය ගැන අප නිතරම උන්වහන්සේට ස්තුතිවන්ත වෙමු. අප හා සමඟ සිටින සහකාර සේවකයින් සහ විවිධ ස්ථානවල සිටින අපගේ පාඨකයින් සියලු දෙනාවත් දෙවියන්වහන්සේ මෙතරම් දුර ගෙන ආ නිසාත් සතුටු වෙමු. අපට විටින් විට ඇතිවන අභියෝග හා අමාරුකම්වලදී ඔබ යාච්ඤාවෙන් අපව දරා ගත් නිසා අපි ඉතා සතුටු වෙමු.



*Vacation Bible School in Santhosahpuram*

**නිවාඩු කාලීන බයිබල් පාසලට** දෙවියන් වහන්සේ කළ බලවත් ආශිර්වාද ගැනද අප උන්වහන්සේට ස්තුතිවන්ත වෙමු. අප්‍රේල් සහ මැයි යන මාස වලදී අප විවිධ ස්ථානවල නිවාඩු කාලීන බයිබල් පාසලක් පැවැත්වූවෙමු. ඒ සඳහා අපට උපකාර කළා වූ සැම සහෝදර සහෝදරියන්ටම හා සියලු සේවකයින්ටම අපි ස්තුතිවන්ත වෙමු. මන්ද ඔබගේ බලවත් සහයෝගය නිසා අපට සාර්ථක සේවයක් කිරීමට හැකි විය. එසේම ඔබගේ යාච්ඤාවත් ඔබග ලබාදුන් සම්මාදම් වලටත් ඔබගේ පරිත්‍යාග වලටත් අපි ඉතා ම සතුටු වන අතර ඒ නිසා අපි ඔබට ස්තුති කරමු.



*The Faculty Meeting of Nehemiah Bible Colleges.*

අප්‍රේල් මස 21 වන දින **නෙහෙමියා බයිබල් විද්‍යාලෙහි** සියලුම ගුරු මණ්ඩලය එකතු වී ඉදිරියේදී කළ යුතු වැඩ ගැන සාකච්ඡා කරනු ලැබීය. දෙවියන් වහන්සේගේ කරුණාවෙන් 2025 සිට 2026 වන වර්ෂය සඳහා **නෙහෙමියා බයිබල් විද්‍යාල** සහ **ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ** පන්ති ආරම්භ කර තිබේ. අපගේ විදුහල්පතිතුමා, උගන්වන ගුරු මණ්ඩලය හා සේවක මණ්ඩලය නිසාත් ඔබගේ යාච්ඤාව අපි බලාපොරොත්තු වෙමු. ක්‍රිස්තුස්වහන්සේ තුළ හවුල් සේවකයෙක් ලෙස ඔබගේ යාච්ඤාව අපගේ සේවය කෙරෙහි අපි බලාපොරොත්තු වෙමු.

*ECHO OF HIS CALL PUBLICATION TEAM*

E.mail : sam@echoofhiscall.org

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ◘ BIBLECOR - Postal Courses (3 languages) ◘ YouTube Ministry ◘ Online Courses ◘ Theological Correspondence Courses (2 languages) ◘ Church Planting ◘ Nehemiah Bible Colleges ◘ Gospel Printing Press ◘ Great Commission Partners ◘ St. Paul's Matriculation School ◘ Crusades ◘ Community Development

Pray for
URGENT NEED
for
CHRISTIAN OFFICE

**1. COMPUTER OPERATORS**
**2. PRINTING PRESS OPERATORS**

Contact : (+91) 98412 71858, E.mail : sam@echoofhiscall.org

**NOTICE**

Please store the Mobile Phone numbers (+91) 98410 71858, (+91) 98412 71858 of Pastor S. Sam Selva Raj on your mobile phones. - Editor




## ඉතා හදිසි දැනුම් දීමක්!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echoofhiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙත ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

1 පිටුවෙන්....

කළ හැකිය. තවද මේ පරිච්ඡේදය තුළ නැති වූ කාසිය ගැනත් තමාගේ පියාගේ නිවස අතහැර ගියා වූ අකීකරු පුත්‍රයා ගැනත් අපි කියවමු. මෙම අකීකරු පුත්‍රයා පියාගේ ප්‍රේමය තේරුම් ගත්තේ නැත.

ඉන්දියාවෙහි ජුනි මාසයේදී පියවරුන්ගේ දිනය සමරයි. එබැවින් පියෙකුගේ ප්‍රේමය ගැන යමක් බෙදා ගැනීමට මා කැමැත්තෙමි.



*Father's love!*

සමහර විට මෙම පණිවිඩය සියලු දෙනාටම අදාල වීමට නුපුළුවන් බව මා තේරුම් ගන්නෙමි. මන්ද සමහරු පියෙක් නැතිවද පියෙකුගේ සෙනෙහස නැතිව ද ඉතා අමාරු තත්ත්වයකින් ජීවිතය ගොඩනගා ගෙන තිබෙනවා ඇත. එවැනි අයට මගේ කණගාටුව මා ප්‍රකාශ කරන්නෙමි. මන්ද සමහර විට මෙයට අදාල වීමට නොහැකි වෙනවා ඇත. එමෙන්ම සමහර මව්වරුන් පියෙකුගේ ස්ථානය ගෙන තනියම ජීවිතයේ විඳින්නාවූ දුක්ගැහැට ගැනත් ඔබ මුහුණ දෙනු ලබන අභියෝගය ගැනත් මා ඉතාම ආඩම්බර වෙමි. මන්ද ඔබ පියෙක් නොමැතිව තම දරුවන්ව හදා වඩා ගනිමින් ඔබ ගිය මාවත ගැන මා ඔබට ස්තුතිවන්ත වෙමි.


එසේම සෙකරියා මෙන් (යොහාන්ද බෞතිස්තගේ පියා) තවමත් දරුවන් ලැබෙන පිණිස යාච්ඤා කරන දෙමාපියන්ට මාගේ ගරුත්වය පුද කරමි. ඔබට ශාරීරික ලෙස ළමුන් නොමැති වුවත් මා විශ්වාස කරනවා දෙවියන් වහන්සේ ඔබට බොහෝ ආත්මික දරුවන් දී තිබේ කියා. එබැවින් ඔබ ධෛර්යමත්ව සිටින්න.



වරක් මා පියවරුන්ගේ දිනයකදී පියකුගේ ප්‍රේමය ගැන දේශනා කළෙමි. දේශනාවෙන් පසුව පියෙක් නිසා දැඩි ලෙස රිදුනු හා කෝපයට පත් තරුණියක් මා හට හමුවිය. ඇයට දෙවියන් වහන්සේගේ ප්‍රේමය හා පියෙකුගේ ප්‍රේමය සමාන කිරීමට බැරි විය. මන්ද ඇගේ පියාගෙන් නොලැබුණු ප්‍රේමය හා ඇය වින්දා වූ දුක්බර කාලය නිසාය. එම නිසා ස්වර්ගීය පියාණන් වහන්සේගේ ස්වභාවය ඇයට ආදරයෙන් පහදා දීමට මට සිදුවිය. අපගේ ලෝකයේ පියවරුන්ට වඩා ස්වර්ගය පියාණන් වහන්සේ කෙතරම් ප්‍රේමණීය පියෙක්ද කියා. තවද මේ පියාණන් වහන්සේ අපගේ ඇතුලාන්ත තුවාල සුව කරන දෙවියන් වහන්සේ කියා පැහැදිලි කළෙමි. ඇය දෙවියන් වහන්සේගේ සැබෑ ප්‍රේමය අත්දැක්කේය. සෑම සංස්කෘතියකදීම පියෙක් හැටියට ඉතාම අනර්ඝ වැඩ කොටසක් තිබේ. පවුලේ හිස නම් පියා වන අතර එම නිවස බලා ගැනීමේ වගකීම ඔහු මත තිබේ. තවද ඉතාම අමාරු තීරණ ගැනීමටත් තමාගේ දරුවන් රැකබලා ගැනීමටත් ඔහුගේ වගකීමයි. දේව වචනය දෙවියන් වහන්සේව අපගේ ස්වර්ගය පියා ලෙස හඳුන්වාදී ඇත. යේසුස් වහන්සේ පවා යාච්ඤා කරන විටදී අපට; **"ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි,"** කියා අමතන්න කියා පැවසීය. (මතෙව් 6:9)

අප දේව වචනයෙන් පියාගැන ටිකක් මෙනෙහි කරමු. ලූක් සුභාරංචියෙහි 15 වන පරිච්ඡේදයෙහි ආත්මික පියෙක් හා ශාරීරික පියෙක් ගැන සඳහන් කරයි.

මෙම පරිච්ඡේදය අප හැමෝම දන්නා වූ උපමාවක් ගැන කතා කරයි. එනම් එම උපමාව පටන් ගන්නේ එක් පියෙකුට දරු දෙදෙනෙක් සිටියේය.



*The younger son feeds the pigs*

බාල පුතා තමාගේ කොටස තමාට අවශ්‍ය යැයි කියා ඔහුගේ උරුමය පියාගෙන් රැගෙන තම නිවසද අත්හැර ලෝකාකාර ජීවිතයක් ගත කළේය. ඔහු තමාට ලැබුණු සියලුම දේ නාස්ති කළ පසු ඔහු ඌරන්ට දමන්නා වූ කෑම කන්නටද පටන් ගත්තේය. මෙවැනි පහත් තත්ත්වයකට වැටුණු විට ඔහුට ඔහුගේ පියා ගැන මතක් විය. ඔහු මා පියා ළඟට නැවත යන්නේ පුතෙක් ලෙස නොව වැඩකාරයෙක් ලෙසටයි කියා ඔහු සිතුවේය.

ඔහු තම පියා වෙතට නැවත ගිය විට පියා ඔහු ඉදිරියට දුවගෙන පැමිණ ඔහුව ඉතා ආදරයෙන් වැළඳ ගත්තේය. තවද පියා ඔහුව ඉතා ආදරයෙන් පිළිගෙන ඔහුට අලුත් වස්ත්‍රයක් දෙමින් ඔහු වෙනුවෙන් සාදයක්ද සූදානම් කරමින් ඔහුගේ නැවත පැමිණීම සැමරුවේය.

නමුත් පියා සමඟ එහි සිටි වැඩිමහල් පුත්‍රයා පියාට විශ්වාසවන්තව සේවය කළ පුතා මෙය දුටු විට තම පියා ඔහුව ගණන් ගත්තේ නැත කියා දුකක් ඇතිවී මෙම සැමරීමට සහභාගී වූයේද නැත. වැඩිමහල් පුත්‍රයා ශාරීරිකව තම පියා වෙත සිටිමින් සේවය කළමුත් ඔහුගේ ඇතුලාන්තය තුළ පියාගේ ප්‍රේමය ගැන දැන සිටියේ නැත. බාල පුතා අකීකරුව ගියත් ඔහු පියාගේ ප්‍රේමණීය චරිතය ගැන හොඳින් හඳුනාගෙන සිටියේය. ඔහු අන් දේශයක සිටියත් එම ප්‍රේමය ඔහු දැන සිටි නිසා ඔහු පියා වෙතට නැවත යාමට තීරණය කළේය. ඔහුව පියා වරදට පත් නොකර ප්‍රේමයෙන් භාර ගනියි කියා ඔහු දැන සිටියේය.

# දෙවියන්වහන්සේ අපගේ පියාණන් වහන්සේයි.

## *(1). ප්‍රේමණීය පියෙකි!*

මෙම උපමාවේ දී බොහෝ අය බාල පුත්‍රයාව ප්‍රධාන චරිතය ලෙස ගණන් ගනියි. නමුත් අප මෙහිදී පියාව උපමාවේ ප්‍රධාන චරිතය ලෙස බලමු. මෙම පියාගේ චරිතය අපට ස්වර්ගය පියාණන් වහන්සේගේ චරිතයට සමාන කිරීමට පුළුවනි. තමාගේ දරුවන්ට ප්‍රේම කරන දෙවියන්වහන්සේ ඔවුන් කරන්නේ මොනවාද කියා නොව ඔවුන් දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස සිතා ඔවුන්ට ප්‍රේම කරන ස්වාමීන්වහන්සේයි. **උන්වහන්සේගේ ප්‍රේමය කොන්දේසි විරහිතයි,**

නික්මයාම 4:22 හි සඳහන් කරන ආකාරයට ඊශ්‍රායෙල් සෙනඟව දෙවියන් වහන්සේගේ **කුළුඳුල් දරුවන්** හැටියට පෙන්වා දෙයි.ඔවුන් දෙවියන්වහන්සේට විරුද්ධව ක්‍රියාකරමින් දිගටම ගමන් කරනු ලැබුවත් ඔවුන්ට උන්වහන්සේ ප්‍රේම කරමින් ඔවුන්ව මුදවා ඔවුන්ට අවශ්‍ය කරන සියලුම දේ ලබාදුන්නේය. **උන්වහන්සේගේ ප්‍රේමය කිසිම මොහොතක වෙනස් නොවන ප්‍රේමයකි.**

මෙම උපමාවෙහි සඳහන් පියා පුතාගේ වැරදි ගැනවත් ඔහුගේ වැටීම ගැනවත් දොස් පවරන්නේ නැතිව ඔහුව ප්‍රේමයෙන් වැළඳගෙන පිළිගත්තේය. ඔහුගේ නැවත පැමිණීම ප්‍රීතියෙන් සැමරුවේය.

අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ කරුණාවෙන් හා දයාවෙන් පිරී සිටින දෙවියන් වහන්සේ වන බැවින් අපගේ නොවටිනාකම් කොපමණ වූවත් උන්වහන්සේ අපව ප්‍රේමයෙන් පිළිගනියි. උන්වහන්සේගේ කරුණාවත් දයාවත් අපට දක්වයි. දේව වචනය අපට මෙසේ උගන්වයි. *"පියවරුනි නුඹලාගේ දරුවන්ට කෝප නූපදවා, ස්වාමීන් වහන්සේගේ හික්මවීමෙන්ද අවවාදයෙන්ද ඔවුන් ඇති කරපල්ලා." (එපීස 6:4)*



*A Loving Father!*

....Contd. to page 6

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජුනි:19-** භාෂා 16කින් නිකුත් කරනු ලබන කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ප්‍රකාශයට පත් කිරීමට උදව් උපකාර කරන්නා වූ හා කැපවී සේවය කරන්නාවූ සහකාර සංස්කරුවන් නිසා ස්තුති කරන්න.

**ජුනි:20-** 1969 වන වර්ෂයේ ආරම්භ වූ අපගේ මෙම සඟරාවට දෙවියන් වහන්සේ විශ්වාසවන්තව ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**ජුනි:21 -** කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උදව් උපකාර කරන්නා වූ සියලු දෙනා නිසා ස්තුති කරන්න.

**ජුනි:22**- 2025 මැයි 14 වන දින මහාබලිපුරම් හි පැවැති නෙහෙමියා බයිබල් විද්‍යාලයේ ශිෂ්‍ය පසුබැසීමට දෙවියන් වහන්සේ ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**ජුනි:23 -** අපට සුභ පතන්නන්ගේ යාච්ඤාව සහ මූල්‍යමය සහයෝගය නිසා ස්තුති කරන්න.

**ජුනි:24-** 2024 -2025 අධ්‍යයන වර්ෂය සඳහා අපගේ නේවාසික හා සන්ධ්‍යා නෙහෙමියා බයිබල් විද්‍යලයේද ශාන්තපාවුලු මෙට්‍රිකියුලෙෂන් පාසලේද සියලු කටයුතු සාර්ථකව නිම කිරීම නිසා ස්තුති කරන්න.

**ජුනි:25-** වසර ගණනාවක් පුරා අපගේ දේවසේවය ඵල දැරීමට දෙවියන් වහන්සේගේ කරුණාව ලැබුණු නිසා ස්තුති කරන්න.

**ජුනි:26-** අපගේ ප්‍රධාන දේවගැති තුමා සහ ඔහුගේ පවුල සියලු ආකාරයේ නපුරෙන් ආරක්ෂා කර දිව්‍යමය රැකවරණය ලබාදුන් නිසා ස්තුති කරන්න.

**ජුනි:27-** 2025 - 2026 වන අධ්‍යයන වර්ෂය සඳහා ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලේ සහ නෙහෙමියා බයිබල් විද්‍යාලයේ ඇතුළත් වීමේ ක්‍රියාවලියට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න

**ජුනි:28-** අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව සහ දේවධර්ම පාඨමාලාව තුලින් ආත්මික බලපෑමක් ඇතිවූ නිසා ස්තුති කරන්න

**ජුනි:29-** යෞවනයන් සහ ළමුන් සුරැකීමේ සේවය හරහා ලොව පුරා සිටින තරුණින් සහ ළමුන් සඳහා දිනපතා රාත්‍රී 10.00ට අපගේ මැදිහත්කාරකමේ යාඥාව නිසා ස්තුති කරන්න.

**ජුනි:30-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවයේ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල් වලට ආරක්ෂාව සහ සැපයීම ලබා දුන් නිසා ස්තුති කරන්න.

**ජූලි:01-** අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල පැවැත්වූ නිවාඩු කාලීන බයිබල් පාසල් වැඩසටහන් තුලින් යහපත් ප්‍රතිඵල ලැබුණු නිසා ස්තුති කරන්න.

**ජූලි:02**- ශ්‍රී ලංකා දේශය තුළ සුභ ආරංචිය ප්‍රකාශ කිරීමට දොරවල් ඇරී තිබෙන නිසාත් දෙවියන් වහන්සේගේ සභාව ආරක්ෂා කර තිබෙන නිසා ස්තුති කරන්න.

**ජූලි:03-** අපගේ බයිබල් විද්‍යාලවල සියලුම සිසුන්ට දෙවියන් වහන්සේගේ ආරක්ෂාව ලබාදී තිබෙන නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූලි:04:** 2025 ලොව පුරා සිටින්නා වූ මිෂනාරිවරුන්ගේ දිව්‍යමය ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**ජූලි:05-** ලොව පුරා වෙසෙන සියලුම ජාතීන් අතර සාමය හා සමාදානය පවතින පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:06-** ආර්ථික ලෙස පීඩිත භාවයට පත්ව සිටින ජනතාවගේ ආර්ථික උන්නතිය ලබාදෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:07-** සුභාරංචිය නොගිය පිටිසර පළාත්වලට මිෂනාරිවරුන්ට යාමට උපකාර කරන පිණිසත් ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව හා ශක්තිය ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:08-** අපගේ මාසය පුරාවටම දෙවියන් වහන්සේ විසින් අපගේ අවශ්‍යතාවයන් සපයා දෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:09-** සෑම ජාතියක් කෙරෙහිම දෙවියන් වහන්සේට භය ඇති නායකත්වයක් බිහිවන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:10-** අපගේ ප්‍රධාන දේවගැති තුමා වන පාස්ටර් එස්. සෑම් සෙල්වරාජ්ට හා ඔහුගේ පවුලට අවශ්‍ය ආරක්ෂාවත් මඟ පෙන්වීම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:11-** අපගේ දේශයෙහි සිදුවන නොයෙකුත් අනතුරු වලින් සියලු මනුෂ්‍යයන්ව ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:12-** 2025 ජූලි මස 2 වන දින නෙහෙමියා බයිබල් විද්‍යාලයේ නව පන්ති ආරම්භ වන හෙයින් එම ශිෂ්‍යයින්ට දෙවියන්වහන්සේගේ මඟ පෙන්වීම ලබාදෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:13-** ලොව පුරා සිටින්නාවූ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ නියුතු සියලුම ආත්මික නායකයන්ට ප්‍රඥාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:14-** ලොව පුරා සිටින අධ්‍යාත්මික නායකයින්ට ප්‍රඥාව සහ ශක්තිය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:15-** අපගේ දේශයේ සිටින බලය ලත් සියලුම නායකයින්ට දේශයේ පාලන කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රඥාව හා මග පෙන්වීම ලැබෙන පිරිසත් දේශීය සමාදානය ලැබෙන පිණිසතයාච්ඤා කරන්න.

**ජූලි:16-** ත්‍රස්තවාදය සහ ප්‍රචණ්ඩත්වයෙන් සියලු ජාතීන්ව ආරක්ෂා කරන පිණිස හා ඔවුන් අතරට සුභ ආරංචි පණිවිඩය යන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:17-** ළමා අපචාර, සමාජ මාධ්‍ය හා මත් රකුසාගෙන් අපගේ දරුවන් සහ තරුණ තරුණියන් ආරක්ෂා කර දෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:18-** දෙවියන් වහන්සේගේ දරුවන්ට අවශ්‍ය යහපත් සුවය, ශක්තිය හා ආර්ථික අවශ්‍යතා සපුරා දෙන පිණිස.

....Contd. from page 4

අපි අපගේ දරුවන්ට තදින් කතා කරන්න අවශ්‍යයි කියාය. එසේම පරුෂ වචනයෙන් කථා කිරීම සාධාරණයයි කියාද සිතයි. නමුත් දේව වචනය අපට පවසන්නේ, අපගේ දරුවන්ට තරවටු කරන විටදී පවා අපි ඉතාම කල්පනාකාරීව ඔවුන්ට කිසිදු හානියක් නොවන ආකාරයෙන් ප්‍රේමයෙන් යුතුව ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය බවයි. අපි අපගේ දරුවන්ව කෝප නොකළ යුතුයි. එනම් දෙවි පියාණන් වහන්සේගේ හදවත තිබෙන ප්‍රේමණීය පියෙක් ලෙස ස්වාමීන් වහන්සේ අපව වෙනස් කළ යුතුයි.

අපගේ යහපත් පියාණන් වහන්සේ අපව උන්වහන්සේ වෙතට නැවත එනතුරු බලා සිටියි. අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ දෑත් දිගු කර ඔබව පිළිගැනීමට සූදානමින් සිටියි.

## ප්‍රේමණීය පියා

ලූක් 15:20 හි මෙසේ පවසයි. ***''නැගිට තමාගේ පියා ළඟට ගියේය. ඔහු දුර සිටියදීම ඔහුගේ පියා ඔහු දැක, අනුකම්පාවී, දුවගෙන ගොස් ඔහුගේ බෙල්ල වැළඳගෙන, ඔහු සිඹගත්තේය."*** මෙම සංවේදී අවස්ථාව පියාගේ හදවතෙහි තිබෙන දේ ප්‍රකාශ කරයි. එනම් ඔහු සැමදාම තමාගේ පුතා එයි කියා ආශාවෙන් මග බලා සිටියේය.

මේ ආකාරයෙන් අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ කැඩුණාවූ සම්බන්ධතාවයන් නැවත ගොඩනැගීමටත් උන්වහන්සේගේ ප්‍රේමය නැවත අප අත්දැකීමටත් අප උන්වහන්සේ වෙතට එනතුරු බලා සිටියි. ආදම් සහ ඒවගේ එම කැඩුනාවූ සම්බන්ධතාවය නැවත අපහා සමඟ ගොඩනැංවීමට උන්වහන්සේ බලා සිටියි.

උන්වහන්සේ ඔබට කරුණාකරන්ට බලා සිටින සේක. ***''එබැවින් ස්වාමීන් වහන්සේ නුඹලාට කරුණාකරන්ට බලා සිටින සේක." (යෙසායා 30:18)*** මෙම උපමාවෙහි සඳහන් කර ඇති පියා මෙන්, උන්වහන්සේගේ දයාව හා කරුණාව ඔබ කෙරෙහි වගුරු වන්නට ස්වර්ගිය පියාණන් වහන්සේ බලා සිටින සේක.

අප ස්වාමීන් වහන්සේ වෙතට නැවත හැරී එන විට උන්වහන්සේ අපව අපහසුතාවයට පත් නොකර අපව අහකට නොදමා උන්වහන්සේ අපව ඉතා ආදරයෙන් වැළඳ ගනී. උන්වහන්සේගේ යහපත්කම අපට ආශිර්වාදයකි. ඔබ අද දවසේදී දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් ඈත් වී සිටිනවා නම්, ඔබ නුසුදුසුය කියා සිතෙනවා නම් නැවත හැරෙන්න ප්‍රමාද නොවන්න. මන්ද උන්වහන්සේ ඔබ නැවත හැරී එනතුරු බලා සිටින සේක.

## උරුමයක් තබා යන්න.

පැරණි කියමනක මෙසේ සඳහන් කර තිබේ; ''පියෙක් කොයි වගේද පුතාත් එසේම වෙයි." පියවරුන් තමාගේ ජාන පමණක් නොව ඔවුන්ගේ ආත්මික ගුණාංග සහ ශාරීරික ගුණාංගත් ඊළඟ පරම්පරාවට උරුම කර දී යන්නේය. බොහෝ තරුණයන්ට ඔවුන්ගේ පළමු වීරයා වන්නේ තමාගේ පියාය. ඔවුන් තමාගේ පියාගෙන් බොහෝ දේ ඉගෙන ගනියි. නමුත් යහපත් දේ දරුවා ලබාගන්නවාක් මෙන් ඉතා අවාසනාවන්ත කාරණය නම් පියාගෙන් වැරදිදේද දරුවන් වෙතට ඉක්මනින්ම ගලායයි. මන්ද පියවරුන් තබා යන උරුමය නම් එම වැරදි ක්‍රියාවන්ය. නමුත් අපි යහපත් පියවරුන් ලෙස තම දරුවන්ට ඔවුන්ගේ ජීවිත වලට ආත්මික වටිනාකමක් දිය යුතුය.

නික්මයාම 15:2 හි අපි මෙසේ කියවමු: ' ***'මාගේ ශක්තිය ද ගීතිකාවද ස්වාමීන් වහන්සේය, උන්වහන්සේ මාගේ ගැලවීම වූ සේක. මේ මාගේ දෙවියන් වහන්සේය, උන්වහන්සේ වර්ණනා කරන්නෙමි; මාගේ පියාණන්ගේ දෙවියන් වහන්සේය, උන්වහන්සේ උසස් කරන්නෙමි."***

මෙම පදයෙහි දෙවියන් වහන්සේ මගේ පියා හැටියටත් ස්වාමීන් වහන්සේ තුළ තිබෙන ඇදහිල්ල ගැනත් මුල් දවසේම ගෙන ගත් බවත් ප්‍රකාශ කරයි.

ද්විතීය කතාව 32:7 හි මෙසේ පවසයි: ***''පුරාණ දවස් සිහි කරව, පරම්පරාවෙන් පරම්පරාවට පසුවූන වර්ෂ කල්පනා කරව. නුඹේ පියාගෙන් අසව, ඔහු නුඹට පෙන්වන්නේය; ........"***

ගීතාවලිය 44:1 මෙලෙස එකතු කරයි, ***''දෙවියන්වහන්ස, පුරාණ කාලය වන, අපේ පියවරුන්ගේ දවස්වලදී, ඔබ කළ ක්‍රියා අපේ කනින් ඇසීමුව, අපේ පියවරු අපට කීවෝය."***

ගීතාවලිය 78:3-4 ප්‍රකාශ කරයි, ***''අපේ පියවරුන් අපට කියා දුන්නා වූ පුරාණයේ වාක්‍යයන් ප්‍රකාශකරන්නෙමි. අපි ඔවුන්ගේ දරුවන් කෙරෙන් ඒ දේ නොසඟවා,***

....Contd. to page 9

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

Pray for

**NEHEMIAH BIBLE COLLEGES,**

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Qualification : 10th Standard & above

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

**Rush for admission!** Medium :Tamil (Part Time)

Hindi (Residential) (Sponsorship Available)

**Diploma in Theology**

Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.

Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## “...කියවන්නා තේරුම් ගනීවා....” *(මතෙව් 24:15)*

**“ස්වාමින්ට ස්තුති කරව්..අපගේ පහත් ස්වභාවයේදී අප සිහිකල උන්වහන්සේට ස්තුති කරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතින්නේය .” (ගීතාවලිය 136:1,23)**

මා මගේ සේවය ආරම්භ කළ කාලයේදී ස්වාමීන් වහන්සේ මට බලය සහ මගේ මනසට මහත් ධෛර්යයක් ලබා දුන්නේය. උන්වහන්සේගේ රාජ්‍ය උදෙසා ඕනෑම අභියෝගයකට මුහුණ දීමටත් ඒ තුළින් උන්වහන්සේව මහිමයට පත් කිරීමටත් කිසි කෙනෙකුගේ කිසිවක් බලාපොරොත්තු නොවී මා දෙවියන් වහන්සේ උදෙසා සෑම අභියෝගයකටම මුහුණ දෙනු ලැබූවෙමි. 1976 සිට 2020 වන වර්ෂය දක්වා මා රජයේ රැකියාවක නියුතු වූ අතර මා රැකියාවෙන් නිතරම නිවාඩු දමා ශුභාරංචිය ප්‍රකාශ කිරීමටත් දේශනා කිරීමටත් කුඩා රැස්වීම් පැවැත්වීමටත් ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලට ගියෙමි. එම සෑම ගමනකටමන්මා මගේම මුදල් වැය කර බොහෝ ප්‍රදේශවලට ගමන් කළෙමි.

මා මගේ ආත්මික මිත්‍රයින් කීප දෙනෙකු සමග ශුභාරංචිය නොගිය ප්‍රදේශවලට ගොස් දහස් ගණන් සෙනගට ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචි පණිවිඩය ප්‍රකාශ කළෙමු. බොහෝ අවස්ථාවන්වලදී මගේ ආර්ථික ප්‍රශ්න වලට දෙවියන්වහන්සේ කෙරෙහි මා විශ්වාසය තැබුවෙමි. එසේම දුම්රියෙහි ගමන් කිරීමට ටිකට්පත් ලබා ගැනීමටත් බස් රථයෙහි ගමන් කිරීමේ දී ටිකට්පත් ලබා ගැනීමටත් නවාතැන් පහසුකම් සඳහා අවශ්‍ය මුදල් ගෙවීමටත් මට හා මගේ මිත්‍රයින්ට දෙවියන් වහන්සේ මහත් ලෙස උපකාර කළේය.

මෙම සේවයේදී චේන්ගල්පුට් නැමැති දිස්ත්‍රික්කය, විල්ලුරෑම්පුරම් දිස්ත්‍රික්කය, මධුරෙයි දිස්ත්‍රික්කය, තිරිච්චි දිස්ත්‍රික්කය සහ කන්‍යා කුමාරි දිස්ත්‍රික්කය, කොඩියිකානල්, ඌටි, තෘවාන්දුන්, පෙරියමේඩ්, ඉදුක්කායි, වන්ඩිප් පෙරිය, විජයවාඩා, බැංග්ලෝර් සහ මයිසූර් ආදී බොහෝ ස්ථානවලට යාමට පුළුවන්කමක් තිබුණි. අපගේ සංගීත භාණ්ඩ සහ පත්‍රිකා තැනින් තැනට ගෙනයන විට අප විවිධ ප්‍රශ්නවලට මුහුණ දුන්නෙමු. මා හට තිබූ ආර්ථික අඩුපාඩු නිසා අපගේ සේවයට අවශ්‍ය වාහනයක් ලබා ගැනීමට හිතන්නටවත් නොහැකි තත්ත්වයක සිටියෙමි. නමුත් දෙවියන් වහන්සේ මගේ සාක්ෂිය අසා මගේ ක්‍රියා කලාපය දෙස බලා; ***‘‘මක්නිසාද නුඹලාගේ වැඩයද නුඹලා ශුද්ධවන්තයන්ට කළාවූ, කරන්නාවූ උපස්ථානයෙන් දෙවියන් වහන්සේගේ නාමයට පෙන්වූ ප්‍රේමයද මතකනැතිකරන්ට උන්වහන්සේ අධර්මිෂ්ඨ නැත.’’ (හෙබ්‍රෙව් 6:10)***

මා සමග සේවය කළා වූ අයව පසු කාලයේදී දෙවියන් වහන්සේ ඉතා ඉහළ ස්ථානයකට ගෙන ආ ආකාරය මා දුටුවෙමි. එසේම දෙවියන් වහන්සේ ඔවුන්ව උන්වහන්සේගේ මිදි වත්තෙහි සේවය උදෙසා පාවිච්චි කරනු ඇත. ස්වාමීන්වහන්සේ මටද විශේෂ ලෙස ආශිර්වාද කරමින් සියලුරෑම පහසුකම් සහිත කාර්, වෑන් සහ ඉතා හොඳ සේවකයින්ද ශුභාරංචිය ප්‍රකාශ කරන පිණිස බොහෝ දොරටුද විවෘත කර තිබේ. එසේම දෙවියන්වහන්සේ මට ආශිර්වාද කරමින් බොහෝ රටවල් වලට යාමටද බොහෝ මිත්‍රයින් මා හට ලබාදී තිබේ. මෙම දෙවියන් වහන්සේ අදත් ජීවමානව සිටිමින් උන්වහන්සේ සමග කැමැත්තෙන් සේවය කිරීමට ආශාවෙන් සිටින්නාවූ අය පැමිණෙනතුරු ආශාවෙන් බලා සිටී. ***‘‘නුඹේ ආහාර ජලය මතුපිට දමාපන්න. කුමක්හෙයින්ද බොහෝ දවසකට පසු ඒවා නුඹට නැවත සම්බවෙයි.’’ (දේශනාකාරයා 11:1)***

උන්වහන්සේ කිසි කෙනෙකුට ණය නැත. පුද්ගලිකව මා ඉගෙන ගත් කාරණය නම්, දෙවියන් වහන්සේගේ රාජ්‍ය උදෙසා අප යමක් කිරීමට සිතනවා නම්, ක්ෂණිකවම ඒ දේ එවලෙහිම කළ යුතුයි. අහස දෙසවත් සුළඟ දෙසවත් බලා සිටියහොත් අපට දෙවියන් වහන්සේට සේවය කිරීමට නොහැකිය. ***‘‘හුළඟ බලාසිටින්නා නොවපුරන්නේය; වළාකුල් බලන්නා කපා නොගන්නේය.” (දේශනාකාරයා 11:4)*** ඔබ දෙවියන්වහන්සේ උදෙසා මේ දේ කරන විට මේ ලෝකයේ සිටින අය ඔබ හා සමග සිටගනී.

මේ දිනවලදී අපගේ සෙනග ඔවුන්ගේ මුදල්, තලෙන්ත හා ජීවිතය දෙවියන් වහන්සේ උදෙසා දීමට අකමැතිය. මන්ද ඔවුන් ක්ෂණිකවම යම්කිසි ආශිර්වාදයක් ලැබෙනවා නම්, ඒවාට කැමතිය. නමුත් ඔවුන් කිසියම් කැපවීමක් කර සේවය කිරීමට කැමති නැත. ප්‍රිය මිත්‍රය, අද මා සැබවින්ම ආශිර්වාද ලබා ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය නිසාය. ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ඉදිරියට

පැමිණ සේවයක් කිරීමට ඔබට පුළුවන්ද? එසේනම් ඔබ ඔබගේ කුරුසිය ගෙන දිනපතාම උන්වහන්සේව අනුගමනය කිරීමට කැමතිද? ස්වාමීන් වහන්සේ උදෙසා ස්වකැමැත්තෙන් සේවය කිරීමට ඉදිරියට යාමට කැමති අයව උන්වහන්සේ සොයමින් සිටී. ***(1 කොරින්ති 9:22)***

දෙවියන්වහන්සේට ඔබ කෙරෙහි තිබෙන විශේෂ සැලැස්ම කුමක්ද කියා මෙම වචනය කියවන විටදී ඔබ දැනගත යුතුයි. මේ ලෝකයේ තිබෙන වස්තුව, සෞඛ්‍ය, සමාදානය, කීර්තිය හා ඇල්මටත් ලෝකෙන් ලැබෙන දේවලුත් ඔබව දිනකදී රවටනු ඇත. නමුත් යේසුස් වහන්සේ ඔබව සැනසීමෙන් තබයි. ***යොහාන් 14:18.*** අදම තීරණයක් ගන්න ඔබ උදෙසා මහත් වූ විපාකයක් තිබේ.

************

*6 පිටුවෙන්....*

***ස්වාමීන්ගේ ප්‍රශංසාවත් ශක්තියත් උන්වහන්සේ කළ ආශ්චර්ය ක්‍රියාත් මතු එන පරම්පරාවට ප්‍රකාශ කරන්නෙමුව."***

දරුවන් තමාගේ පියවරුන්ගෙන් ඉගෙන ගන්නවාය කියා මේ පදවලින් අපට පැහැදිලිව උගන්වයි. සෑම පියෙකුගේම වගකීම නම්, ඔවුන් තමා තුළ තිබුන ආත්මික වගකීමත් දිව්‍යමය වටිනාකමත් ඊළඟ පරම්පරාවට උරුමකර දීමයි.

දෙවියන් වහන්සේගේ වචනයෙන් අපට මේ සම්බන්ධව බොහෝ උදාහරණ දී තිබේ. විශේෂයෙන් ඊශ්‍රායල් සහ යුදා රජවරු දෙස බලන විටදී ඔවුන්ගේ දරුවෙක් තමාගේ පියාගේ පසුව රජකමට පත් වූ විට පියා කළා වූ අයුතු දේවල් සහ ඔවුන් කළා වූ වැරදි ක්‍රියාවන් ඔවුන්ද කල බවයි. 2 රාජාවලිය 21:21 හි අපට පෙනෙන්නේ මනසේගේ පුත්‍රයෙක් වන ආමොන්;

**''තමාගේ පියා හැසුරුණ මුළු මාර්ගයෙහිම හැසිර, තමාගේ පියා සේවය කළ දේව රූපවලට සේවය කරමින් ඒවාට නමස්කාර කෙළේය."**

***කොතරම් වේදනාකාරී තත්ත්වයක්ද?***

මනස්සේ යනු, හෙසකියා නමැති ප්‍රධාන රජෙකුගේ පුත්‍රයෙකි. එනම්; ඔහුගේ පියා දෙවියන්වහන්සේට ප්‍රේම කරමින්, උන්වහන්සේ කැමති දේ ඉටු කළා වූ කෙනෙකි. නමුත් මනස්සේට සිදුවූයේ



*Solomon wives led him astray after other gods*

කුමක්ද? ඔහුට තම පියාගේ මාර්ගයෙහි යාමට නොහැකි වූයේ ඇයි? මෙය ඉතා වැදගත් ප්‍රශ්නයකි. හැම පියෙක්ම ඇසිය යුතු ප්‍රශ්නය නම්; මා මගේ දරුවන්ට තබා යන්නේ කුමන උරුමයක්ද?

1 රාජාවලිය 11:4 හි මෙසේ පවසයි. ***''සාලමොන් මහලු වූ කල ඔහුගේ භාර්යාවෝ ඔහුගේ සිත අන් දෙවිවරුන් වෙතට හැරෙව්වෝය. ඔහුගේ සිතද තමාගේ පිය වූ දාවිත්ගේ සිත මෙන් තමාගේ දෙවිවූ ස්වාමීන් වහන්සේ කෙරෙහි සම්පූර්ණව නොතිබුණේය."***

දේව වචනය තුළ දිගටම අපට පෙනී යන්නා වූ දේ නම් බොහෝ රජවරු දිව්‍යමය උරුමය තමාගේ දරුවන්ට තබා යාමට අසමත් වූ බවයි. ඒ නිසා ඒ දරුවන්ගේ ජීවිතය, ඔවුන්ගේ පරම්පරාවටම ශාපයක් වූවෝය. ආසා, යෙහෝෂාපාට් සහ යොෂියා යන රජවරුන් ඔවුන්ගේ පියවරුන්ගේ අඩි පාරේ යමින් ඇදහිල්ලේ ආදර්ශයක් දුන් අතර ඔවුන්ගේ කීකරුකම කොටගෙන ඔවුන්ගේ මුළු පවුලටම හා ඔවුන්ගේ අසල්වාසීන්ටද සමාදානය ගෙන දුන්නේය. 2 ලේකම් 17:10 හි මෙසේ ප්‍රකාශ කරයි; ***''යුදා අවට දේශවල සියලු රාජයයන් පිටට ස්වාමීන් වහන්සේගෙන් භීතියක් පැමිණුන නිසා ඔවුහු යෙහෝෂාපාට්ට***



*The fear of the LORD fell upon all the kingdoms*

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

*විරුද්ධව යුද්ධ නොකළෝය."* අපගේ දරුවන්ටත් මතු පරම්පරාවටත් අප තබා යන්නේ කුමන උරුමයක්ද?

අද දෙවියන්වහන්සේගේ දාසයෙන් පවා මෙවැනි අවදානම් තත්ත්වයකට පත්ව සිටී. මෝසෙස්, ඒලි, සාමුවෙල් සහ දාවිත් යන මේ සියලු දෙනාම ඉතා බලවත් දේවදාසයින්ය. නමුත් පියෙක් ලෙස ඔවුන්ට විශාල අරගලයක් තිබුණි. අද දේව සේවයේදී ද මෝසෙස් යෝෂුවාවාට උරුමය දුන් ලෙස, එලියා එලිෂාට උරුමය දුන් ලෙස සිදුවෙනවා විය හැක. නමුත් අපගේම දරුවන්ට දෙවියන් වහන්සේ කෙරෙහි තිබෙන්නා වූ ගරුබියත් උන්වහන්සේ ගැන දැනගැනීමේ උරුමයත් අප ඔවුන්ට දී තිබෙනවාද?

මෙම අකීකරු පුත්‍රයාගේ උපමාවෙන් අප යමක් ඉගෙන ගනිමු. නැවත පැමිණි තම අකීකරු පුත්‍රයාව පිළිගැනීමට එම පියා කුමන වේලාවකවත් අතපසු කළේ නැත. ඒ ආකාරයට අපගේ ස්වර්ගය පියාණන් වහන්සේ අපව ප්‍රේමයෙන් කැඳවනු ලබයි. යහපත් පියවරු ඇදහිල්ලෙන් පිරුණා වූ උරුමයක් තමාගේ දරුවන්ට තබා යා යුතුයි. අප අපගේ දරුවන්ට ආදර්ශයක් වෙමින්, දෙවියන් වහන්සේගේ මාර්ගයේ ගමන් කිරීමෙන් යහපත් ආදර්ශයක් ඇති පියවරු වෙමු.

*************

# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
on 2nd **JUNE 2025.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**